# 9 ජාතික සෞඛ්‍ය රක්ෂණය( *Kokumin Kenkōhoken* )

සන්මු නගරයේ පදිංචි සිටින සියලුම පුද්ගලයින් කරුණාකර සෞඛ්‍ය රක්ෂණයට ඇතුල් වන්න. සෞඛ්‍ය රක්ෂණයන්, ඔබ රාජකාරියේ යෙදීසිටින සමාගම විසින් ඇතුළත් කරනු ලබන සෞඛ්‍ය රක්ෂණය , සමාජ සෞඛ්‍ය රක්ෂණය 「 *Shakaihoken* 」 ලෙසත් නගරසභාව විසින් හඳුන්වාදෙනු ලබන සෞඛ්‍ය රක්ෂණය, ජාතික සෞඛ්‍ය රක්ෂණය 「 *Kokumin Kenkōhoken* 」 යනුවෙන්නුත් හඳුන්වනු ලබන සෞඛ්‍ය රක්ෂණ වර්ග දෙකක් ඇත.

ජාතික සෞඛ්‍ය රක්ෂණය 「 *Kokumin Kenkōhoken* 」 නගරසභාව විසින් ඇතුලත් කරගනු ලබන සෞඛ්‍ය රක්ෂණයට ඇතුළත් වීමේදී නගරසභාවේ ＜ ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* ) ＞ වෙත ගොස් කරුණාකර උපදෙස් ලබාගන්න.

## (1) ජාතික සෞඛ්‍ය රක්ෂණය යනු ( *Kokumin Kenkōhoken* ) ?

අසනීප වූ විට රෝහලේදී ඔබ ගෙවන මුදල් ප්‍රමාණය අඩු කිරීම සඳහා භාවිතා කරනු ලබන උපකල්පන ක්‍රමයක් ලෙස නම් කළහැක.මේ සඳහා බද්දක් ගෙවීම අත්‍යවශ්‍ය වේ.

සෞඛ්‍ය රක්ෂණයට ඇතුල් වූ විට ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* ) ＜ *Hoken Kādo* ＞ නිකුත් කරනු ලැබේ.

රෝහලකට යෑමේදී කරුණාකර මෙම ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත රැගෙන යායුතුයි.




රෝහලේදී මුදල් ගෙවිය යුතු ආකාරය පහත සඳහන් ලෙස පෙන්වාදිය හැක.

■ රෝහලේදී ඔබ මුදල් ගෙවන ප්‍රමාණය

| වයස 0 සිට අවුරුදු 6 දක්වා | → | වයස අවුරුදු 7 සිට අවුරුදු 69 දක්වා | → | වයස අවුරුදු 70 සිට අවුරුදු 74 |
|---|---|---|---|---|
| 20% | | 30% | | 20% ( වැටුපවැඩි පුද්ගලයින් 30% ) |

[ විමසීම ] ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* )
☎0475-80-1143

◎ 24 පිටුවේ අමාරු වචන◎

※ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* ) ＜ *Hoken Kādo* ＞ : ජාතික සෞඛ්‍ය රක්ෂණයට ඇතුල් වීමේදී ලැබෙන කාඩ්පත

## (2) පහත සදහන් පුද්ගලයින් ජාතික සෞඛ්‍ය රක්ෂණය සදහා ඇතුලත් විය නොහැකිය

- සමාගමේ <u>සමාජ සෞඛ්‍ය රක්ෂණය ( *Shakaihoken* )</u> ට ඇතුලත් වී සිටින පුද්ගලයින්
- <u>සමාජ සෞඛ්‍ය රක්ෂණය ( *Shakaihoken* )</u> ට ඇතුළත් වී, යැපෙන්නන් සදහා මුදල් වියදම් කරන පුද්ගලයෝ
- අවුරුදු 75 ටවඩා වයසින් වැඩි පුද්ගලයින්
- <u>ජීවන සහනාධාර ( *Seikatsu Hogo* )</u> ලබාගන්නා පුද්ගලයින් ( තමන් විසින් ජීවන වියදම් සපයා ගැනීමට නොහැකි පුද්ගලයින් සදහා ජපන් රජය විසින් ජීවන වියදම වෙනුවෙන් සහනාධාර මුදලක් සපයනු ලැබේ. )
- ජපානයේ පදිංචි කාලය මාස 3කට වඩා අඩු කාලයක් පවතින පුද්ගලයින්

[ විමසීම් ] ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* )
☎0475-80-1143

## (3) ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ( *Kokumin Kenkōhokenzei* )

ජාතික සෞඛ්‍ය රක්ෂණට ඇතුල් වූ විට ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු < *Kokumin Kenkōhokenzei* > අයකරගනු ලැබේ. ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු, තීරණය කරඇති දිනයට පෙර ගෙවිය යුතුය. අදාල පුද්ගලයාගේ පෙර අවුරුද්දේ ලබාගත් වාර්ෂික වැටුපට අනුව වර්ෂයකට ගෙවිය යුතු බදු මුදල තීරණය කරනු ලැබේ.

[ විමසීම් ] බදුගෙවීමේ අංශය ( *Kazeika* )
☎0475-80-1281

## (4) ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ( *Kokumin Kenkōhokenzei* ) ගෙවීම පිළිබදව

ජූලි මාසයේදී ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ( *Kokumin Kenkōhokenzei* ) ගෙවීමේ ලිපි නිවසට ලැබුණු විටකරුණාකර බදු මුදල් ගෙවිය යුතුයි. ඔබගේ <u>බැංකු ගිණුමෙන් ස්වයංක්‍රීයව මුදල් ගෙවීම ( *Kōza Furikae* )</u> ට කැමති පුද්ගලයින් නගරසභාවේ < බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) > වෙත ගොස් කරුණාකර උපදෙස් ලබාගන්න. වැඩිවිස්තර දැනගැනීම සදහා නගර සභාවේ < බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) > වෙත පැමිණෙන්න.ජාතික සෞඛ්‍ය රක්ෂණය සදහා වන බදු මුදල්, අදාල දිනට ගෙවීමට අපහසු අය නගරසභාවේ < බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) > වෙත ගොස් කරුණාකර උපදෙස් ලබාගන්න.

පහත සදහන් ස්ථාන වලදී සහ ආකාරයන්ට අනුව ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ( *Kokumin Kenkōhokenzei* ) ගෙවිය හැකිය .

- නගරසභා කාර්යාලය
- කොන්බිනි
- බැංකුව
- තැපැල් කාර්යාලය
- මුදල් වෙනුවට භාවිතා කරන විද්‍යුත් ගෙවීම් ක්‍රම 〔 පේපේ (PayPay),ලයින් පේ (LINE Pay) , ඩි පේ(D-Pay) , ජේ කොයින් (J-coin) , එජ්යූ පේ (auPay) 〕

[ විමසීම් ] බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* )
☎0475-80-1151

## （5）නියමිත දිනයට පෙර ගෙවීම් නොකළවිට ඔබ බෙහෙවින්ම අපහසුතාවයට පත්වේ

ජාතික සෞඛ්‍ය රක්‍ෂණ බදු නොගෙ වූ විට පහත සඳහන් ආකාරයට සිදුවේ.

- <u>බදු මුදල් ගෙවීම සඳහාඉල්ලා සිටීමේ ලිපිය ( *Tokusokujō*)</u> යවනු ලබනවා
- එවිට ඔබගේ සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත නගරසභාවේ < ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* ) > ට ආපසු භාර දිය යුතුයි.
- රෝහලට අධික මුදලක් ගෙවීමට සිදුවේ. සියලුම මුදල් ඔබ විසින් ගෙවිය යුතුයි.
- සෞඛ්‍ය රක්‍ෂණ බදු මුදල් නොගෙවූ විට ඔබගේ වීසා බලපත්‍රය දීර්ඝ කිරීම හා 〔 ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත (*Zairyū Kādo*)〕 ලබාගැනීමට නොහැකිවන අවස්ථාද ඇත.

［ විමසීම් ］බදු එක් රැස් කිරීමේ අංශය ( *Shūzeika* )
☎0475-80-1151

## （6）ජාතික සෞඛ්‍ය රක්‍ෂණට ඇතුල් වීමේදී සහ එයින් ඉවත් වීමේදී පහත සඳහන් ආකාරයට සිදුවේ

ඊලග වාරයේදී දින 14 ක්ඉකුත් වීමට පෙර නගරසභාවේ <ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* )> වෙත පැමිණෙන්න.

**ජාතික සෞඛ්‍ය රක්‍ෂණයට ( *Kokumin Kenkōhoken* ) ඇතුල්වීම**

- සන්මු නගරයේ පදිංචියට පැමිණිවිට
- තම සමාගමේ සමාජ සෞඛ්‍ය රක්‍ෂණ ( *Shakaihoken* ) යෙන් ඉවත් වූ විට
- දරුවෙක් ඉපදුන විට
- නගරසභාව විසින් ලබාදෙන <u>ජීවන සුහසාධන මුදල් ( *Seikatsu Hogo* )</u> ලබාගැනීම නැවැත්වූ විට

**ජාතික සෞඛ්‍ය රක්‍ෂණයෙන් ඉවත් වීම**

- සන්මු නගරයේ පදිංචියෙන් ඉවත් වන විට
- තම සමාගමේ සමාජ සෞඛ්‍ය රක්‍ෂණය ( *Shakaihoken* ) ට ඇතුල් වූ විට
- මරණයට පත්වූ විට
- නගරසභාව විසින් ලබාදෙන <u>ජීවන සුහසාධන මුදල් ( *Seikatsu Hogo* )</u> ලබාගන්නා විට

［ විමසීම් ］ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* )
☎0475-80-1143

◎ 25 පිටුවේ සහ 26 පිටුවේ අමාරු වචන ◎

※සමාගම් රක්ෂණය : සමාගමක සේවයේ යෙදී සිටින පුද්ගලයින් සඳහා වූ සෞඛ්‍ය රක්‍ෂණය,සමාජ සෞඛ්‍ය රක්‍ෂණය ( *Shakaihoken* ) ලෙස හඳුන්වනු ලබයි සමාජ සෞඛ්‍ය රක්‍ෂණය ( *Shakaihoken* ) ජාතික සෞඛ්‍ය රක්‍ෂණ ( *Kokumin Kenkōhoken* ) හා සමාන සෞඛ්‍ය රක්‍ෂණවර්ගයක් ලෙස හඳුන්වනු ලැබේ.හ ජපානයේ ජීවත් වන සෑම පුද්ගලයෙක්ම ජාතික සෞඛ්‍ය රක්‍ෂණය ( *Kokumin Kenkōhoken* ) හෝ සමාජ සෞඛ්‍ය රක්‍ෂණය ( *Shakaihoken* ) යන රක්ෂණ වර්ග දෙකෙන් එකකට ඇතුල් විය යුතුය.

※ජීවන <u>සුහසාධන</u> සහනාධාර ( *Seikatsu Hogo* ) : තමන් විසින් ජීවන වියදම් සපයා ගැනීමට නොහැකි පුද්ගලයින් සඳහා ජපන් රජයෙන් ජීවන වියදම සඳහා සහනාධාර මුදලක් සපයනු ලැබේ.

※බැංකු ගිණුමෙන් ස්වයංක්‍රීයව මුදල් ගෙවීම ( *Kōza Furikae* ) : බැංකුව හරහා ස්වයංක්‍රීයව වෙනත් ගිණුම් හිමියෙකුට මුදල් ගෙවීම

※බදු මුදල් ගෙවීම සඳහාඉල්ලා සිටීමේ ලිපිය ( *Tokusokujō* ) : බදු මුදල් නියමිත දිනට පෙර නොගෙවූ පුද්ගලයින් සඳහා නගරසභාවේ බදුගෙවීමේ අංශයෙන් අදාල පුද්ගලයින් වෙත යවන ලිපිය.

— සටහන් —



| වැඩි විස්තර දැනගැනීම සඳහා(විමසීම්) | ලිපිනය | දුරකථන අංක |
| --- | --- | --- |
| ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය<br>( *Kokuho Nenkinka* ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑥ | 0475-80-1143 |
| බදු ගෙවීමේ අංශය ( *Kazeika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑦ | 0475-80-1281 |
| බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑧ | 0475-80-1151 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා දිනයන්හිපෙරවරු8.30සිට පස්වරු5.00දක්වා

※ඉල්ලුම් කිරීමේදී මෙහි සිදුකෙරෙන කාර්යයන් සඳහා කාලය ගතවේ. වේලාසනින් නගරසභාවට පැමිණ ඉල්ලුම් කරන්න.

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.